# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
## නීති පීඨය
## නීතිවේදී උපාධි පරීක්ෂණය, දෙවන වසර - 2022
## ගිවිසුම් නීතිය
(පැ තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : **06**

ප්‍රශ්න **<u>තුනකට (03)</u> පමණක්** පිළිතුරු සපයන්න.

(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

01 (i) ප්‍රසිද්ධ නිර්මාණ ශිල්පිණියක වන සුනීතා වෙත ලක්මාලි තමාගේ මංගල ඇඳුම මැසීම සඳහා අර්පණය කරන ලදි. ලක්මාලි සුනීතාගේ සාප්පුවෙන් ඇඳුම සඳහා සුදුසු රෙදි වර්ගය, මෝස්තරය සහ වර්ණය තෝරුවාය. විවාහයට දින දෙකකට පෙර ඇඳුම භාරදෙනැයි බලාපොරොත්තුවන වන බව ඇය තවදුරටත් සඳහන් කළාය. සුනීතා ඇඳුමෙහි වියදම ගණනය කළ අතර එය රුපියල් 250,000/- ක් ලෙස සඳහන් විය. ලක්මාලි සාප්පුවෙන් පිටව ගිය අතර දින දෙකකට පසුව සුනීතා වෙත කෙටි පණිවිඩයක් යවමින් ඇඳුම රුපියල් 220,000/- කට මිලදී ගැනීමට විමසීය. සුනීතා එම පණිවිඩයට ප්‍රතිචාර නොදැක්විය. ඇඳුම භාරදීමට නියමිත දිනයේදී ලක්මාලි සුනීතාට දුරකථන ඇමතුමක් ලබාදුන් අතර ඇයට දැන ගැනීමට ලැබුනේ ලක්මාලි ඉල්ලා සිටින මිලට ඇඳුම සකස් කිරීමෙන් සුනීතාට පාඩුවක් වන බැවින් ඇඳුම නොමැසූ බවය. සුනීතා ගිවිසුම කඩකර ඇති බවට ලක්මාලි තර්ක කරයි.

(අ) ලබා දී ඇති සිදුවීමෙහි පාර්ශවයන් අතර වලංගු ගිවිසුමක් පවතීද යන්න සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර විනිශ්චිත නඩුතීන්දු ඇසුරින් සනාථ කළ යුතුය.

(ලකුණු 40)

(ආ) ලක්මාලි එකඟ වූ මිලෙහි යම් වෙනසක් ඇසීම වෙනුවට ඇය විසින් තෝරන ලද රෙදි වර්ගය රාත්‍රී කාලයේ ඡායාරූපගත කිරීම සඳහා සුදුසු දැයි විමසුවේ නම් ඔබගේ පිළිතුර වෙනස් වන්නේද?

(ලකුණු 20)

(ii) ප්‍රතිග්‍රහණය සන්නිවේදනය කිරීමට අදාලව 'තැපැල් රීතියෙහි' වැදගත්කම පොදු නීතිය යටතේ දැඩිව ස්ථාපිත වී ඇත.

ඔබ එකඟ වන්නෙහි ද? සාම්ප්‍රදායික ආකාරයේ ගිවිසුම් සඳහා සහ ක්ෂණික ගිවිසුම් සඳහා තැපැල් රීතියෙහි බලපෑම සහ ස්වභාවය සාකච්ඡා කරන්න. නඩු තීන්දු අධිකාරීන් ඇසුරින් ඔබගේ පිළිතුර සනාථ විය යුතුය.

(ලකුණු 40)

02. "රෝම ලන්දේසි නීතිය යටතේ සදාචාරාත්මක යුතුකමක් හෝ ත්‍යාගශීලී ක්‍රියාවක් කිරීමට හෝ කාරුණිකබව ඇසුරින් චේතනාන්විතව ලබා දුන් පොරොන්දුවක් නීතියෙන් බලාත්මක කළ හැකිය. සාධාරණ හේතුව යන්න රෝම ලන්දේසි නීතියට අනුව පොරොන්දුවක ස්ථිර පැවැත්ම සඳහා ප්‍රමාණාත්මක වන අතර ඉංග්‍රීසි නීතියේ සලකනු ලබන පොරොන්දුවක් සඳහා වන ප්‍රතිෂ්ඨාවට වඩා බොහෝ පුළුල් වේ."

-*Indian Bank v. Acuity Stock Brokers (Pvt) Limited* (2011) 2 Sri LR 150.

නඩු තීන්දු නීතියෙන් උදාහරණ ගෙනහැර දක්වමින් ඉංග්‍රීසි නීතිය යටතේ වන ප්‍රතිෂ්ඨාව සහ රෝම ලන්දේසි නීතිය යටතේ වන සාධාරණ හේතුව යන්න ඉහත ප්‍රකාශය ඇසුරින් වෙන්කර දක්වන්න. කුමන සන්දර්භයක් යටතේ කොතෙක් දුරට එක් එක් සංකල්පයන් ශ්‍රී ලංකාවේ අදාල වී තිබේද යන්න උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 100)

03. 'ANC Devices' යනු කොළඹ පිහිටි ප්‍රසිද්ධ පරිගණක දෘඩාංග විකුණුම්කරුවෙකි. 'ITT' යනු තොරතුරු තාක්ෂණ ඉගැන්නුම් ආයතනයකි. ITT ඔවුන්ගේ නව අධ්‍යන වර්ෂය 2022 සැප්තැම්බර් 10 වන දින ආරම්භ කිරීමට සැලසුම්කර ඇති අතර ANC Devices වෙතින් ඩෙක්ස්ටොප් වර්ගයේ පරිගණක 30ක් සහ ලැප්ටොප් වර්ගයේ පරිගණක 15ක් ඇණවුම්කර සැප්තැම්බර් 10 වන දිනට පෙර සවිකිරීම සඳහා සැප්තැම්බර් 08 වන දින උදෑසනට පෙර භාර දෙන ලෙස ඉල්ලා තිබුණි. අධික වර්ෂාව හේතුවෙන් ANC Devices සැප්තැම්බර් 9 වන දින භාරදීම සිදු කළ අතර ITT වෙත දැනුම් දෙනු ලැබුයේ රටේ වර්තමාන ආර්ථික අර්බුදය හේතුවෙන් ඔවුන්ට පරිගණක වල මිල වැඩි කිරීමට සිදුවූ බවය. ITT විසින් ESUS වර්ගයේ ලැප්ටොප් ඇණවුම් කළ නමුත් ANC Devices විසින් BP වර්ගයේ ලැප්ටොප් භාර දෙන ලදි. එකඟතාවයට අනුව පරිගණක ITT හි පරිගණක විද්‍යාගාරයෙහි සවි කිරීමට ANC එකඟ විය. "සියල්ල නිසි ලෙස සවිකර අවසන් වනතුරු සියලුම පරිගණක ANC භාරයේ පැවතිය යුතු බවත්; මෙම වගන්තියට අනුකූල නොවීමෙන් සිදුවන හානි සඳහා ANC කිසිදු වගකීමක් නොගන්නා බවත්" ගිවිසුමේ වගන්තියක සඳහන් වේ. ITT හි තාක්ෂණික නිළධාරිවරයා උපාංග පරීක්ෂාකරන විටදී විදුලි සැපයුම උච්ඡාවචනය වීම් හේතුවෙන් පරිගණක 6 ක් කැඩී ගියේය. උභතෝකෝටික තත්ත්වයකට මුහුණදී සිටින පාර්ශවයන් ඔබගේ උපදෙස් පතයි.

'ගිවිසුමික වගන්ති' ආශ්‍රිත නීතිය කෙරෙහි අවධානය යොමු කරමින් පාර්ශවයන්ට උපදෙස් දෙන්න.

(ලකුණු 100)

04. (i) මර්වින්ට රත්නපුරයේ පිහිටා ඇති ඔහුගේ පර්චස් 40 ක ඉඩම විකිණීමට අවශ්‍ය විය. නගරසභාව විසින් මර්වින් වෙත දැනුම්දෙනු ලැබුයේ ඔහුගේ ඉඩම ගංවතුර තර්ජනයට ලක්ව ඇති බවයි. එමනිසා මර්වින්ට එය ඉක්මනින් විකිණීමට අවශ්‍ය වූ අතර ඔහුගේ ඥාතියෙක් වන සුසිලාට එය මිලදී ගන්නා ලෙස පැවසුවේය. මර්වින් සුසිලාට ප්‍රකාශ කරනු ලැබුයේ ඇය ඉඩම් කොටස මිලදී ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් මර්වින්ගේ ඉඩම අසල පිහිටි සුසිලාට අයත් දැනට සිදු කෙරෙමින්

පැවතෙන ඉදිකිරීම් වලට බාධා සිදු විය හැකි බවයි. හැන්නෑ හැවිරිදි සුසිලාට කිසිදු විටක එම දේපල මිලදී ගැනීමට අවශ්‍ය නොවූ නමුත් මර්වින් වෙතින්වූ පීඩනය හේතුවෙන් දේපළ මිලදී ගැනීමට තීරණය කළාය. පසුව සුසිලා දැනගනු ලැබුයේ අධික වර්ෂාව හේතුවෙන් ඉඩම ගං වතුරට යටවී ඇති බවය. දැන් ඇයට ගිවිසුම අවලංගු කිරීමට අවශ්‍ය වී ඇත.
සුසිලාට උපදෙස් දෙන්න.

(ලකුණු 40)

(ii) Modern Furniture යන ගාල්ලේ පිහිටා ඇති ගෘහ භාණ්ඩ සාප්පුව දැව සහ ෆයිබර් යන ද්විත්ව ගෘහභාණ්ඩ විකිණීම සිදු කරයි. ජයතුංග හට ඔහුගේ අළුතෙන් සාදන ලද නිවසට දැව ගෘහ භාණ්ඩ, විශේෂයෙන් තේක්ක වලින් නිමවූ භාණ්ඩ මිලදී ගැනීමට අවශ්‍ය විය. ජයතුංග තමාගේ අදහස් ඉදිරිපත් කළ අතර Modern Furniture ඔවුන්ගේ සියලුම ගෘහ භාණ්ඩ පෙන්වූ අතර සමහර ඒවා දැවයෙන් ද සමහර ඒවා ෆයිබර් වලින් ද සාදා තිබුණි. ජයතුංග සියලුම භාණ්ඩ තේක්ක බවට වන අවබෝධයෙන් ගෘහ භාණ්ඩ සැහෙන ප්‍රමාණයක් මිලදී ගත්තේය. මාස කිහිපයකට පසු ඔහුට අවබෝධ වූයේ ගෘහභාණ්ඩ කිහිපයක් ෆයිබර් වලින් සකසා ඇති අතර ඒවා එතරම් හොඳ තත්ත්වයේ නොපවතින බවයි. ජයතුංග මේ පිළිබඳව Modern Furniture වෙතින් විමසූ විට ඔවුන් දැනුම්දෙනු ලැබුයේ දුඹුරු වර්ණයෙන් වර්ණ ගැන්වූ දැව සහ ෆයිබර් යන දෙවර්ගයේම ගෘහ භාණ්ඩ විකිණූ බවය. ජයතුංගට අවශ්‍ය වූ ආකාරයට සියලුම භාණ්ඩ විකිණූ බවට වන හැඟීම Modern Furniture වෙත විය.
නෛතික කරුණු සාකච්ඡා කරන්න. ජයතුංග හට තේක්ක ගෘහභාණ්ඩ මිලදී ගැනීමට අවශ්‍ය වූ බව Modern Furniture දැන සිටියේ නම් ඔබගේ පිළිතුර වෙනස් වන්නේද? පැහැදිලි කරන්න.

(ලකුණු 60)

05. (i) පහත අවස්ථාවලදී වලංගු ගිවිසුමක් සංස්ථාපනය වී තිබේ දැයි හේතු දක්වමින් සලකා බලන්න.

(අ) AV (Pvt) Ltd යනු ශාකසාර රූපලාවන්‍ය වර්ග නිෂ්පාදනය සහ අලෙවි කිරීම සිදු කරන මීගමුවේ පිහිටි නමගිය සමාගමකි. මෙම සමාගමට ආයුර්වේද සම පැහැපත් කරන 'සුවත්' සහ 'හද' යන ආලේපන අලෙවි කිරීම සඳහා 1980 අංක 27 දරන රූපලාවන්‍ය, උපාංග සහ ඖෂධ (CDD) පනත යටතේ බලපත්‍ර දෙකක් ඇත. 'හද' ආලේපනය නිෂ්පාදනය සඳහා AV සමාගමේ බලපත්‍රය මෑතකදී අවසන් විය. සමාගමට එය අලුත් කිරීමට අමතක වූ නමුත් සති කිහිපයකින් එය සිදු කිරීමට සැලසුම් කර ඇත. පනතේ 2(1) වගන්තිය දක්වන්නේ "කිසිදු පුද්ගලයෙක් රූපලාවන්‍ය, උපාංග සහ ඖෂධ (CDD) අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව කිසිදු රූපලාවන්‍ය ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීම හෝ ආනයනය කිරීම නොකළ යුතු" බවයි. කෙසේ වෙතත් AV සමාගම නිමල් සමඟ 'හද' සහ 'සුවත්' ආලේපන බෝතල් 500ක් විකිණීමට ගිවිසුමකට එළැඹුණු අතර මාස හයකට පසුව අදාළ මුදල ලබා ගැනීමට එකඟ විය.

(ආ) ෆාමිනා යනු 2018 මාර්තු මාසයේදී First Care පෞද්ගලික රෝහලට ("First Care") සම්බන්ධ වූ හෙද නිලධාරිනියකි. "First Care" හා සම්බන්ධ වූ පසු ඇය එළැඹුණු ගිවිසුමෙහි "First Care" හි සේවයෙන් ඉවත්වීමෙන් පසු වසර දහයක (10) කාලයක් යන තුරු ෆාමිනාට හෙද නිලධාරිනියක ලෙස ශ්‍රී ලංකාවේ වෙනත් කිසිදු රෝහලකට සම්බන්ධ වීම තහනම් කිරීමේ කොන්දේසියක් අඩංගු විය. 2021 මාර්තු මාසයේදී ෆාමිනා "First Care" ආයතනයෙන් ඉල්ලා අස්වී DD පෞද්ගලික රෝහලට හෙද නිලධාරිනියක ලෙස සම්බන්ධ විය. ෆාමිනා සිතන්නේ ඇය සහ "First Care" අතර ඇති ගිවිසුම වලංගු නොවන බවයි.

(25x 2 = ලකුණු 50)

(ii) ප්‍රනාන්දු මහත්මියට මාතර මිරිස්ස ප්‍රදේශයේ තානායම් දෙකක් ඇත. යුරෝපීය සංචාරකයින් පිරිසකට නවාතැන් ගැනීම සඳහා තානායම් කුලියට දීමට 2019 ජනවාරි මාසයේදී ඇය ABC Services සමඟ ගිවිසුමකට එළඹුණාය. ABC Services එවේලෙහිම ප්‍රනාන්දු මහත්මියට රු. 300000/- ගෙවූ අතර හිඟ දින 30ක් සඳහා දෛනික කුලී පදනමින් ABC Services විසින් ප්‍රනාන්දු මහත්මියට ගෙවිය යුතු විය. තානායම් සඳහා යම් යම් වෙනස්කම් අවශ්‍ය වූ බැවින්, සංචාරකයින් පැමිණීමට පෙර නියමිත වේලාවට එම අලුත්වැඩියා කටයුතු 2019 මැයි 30 වන විට නිම කිරීමට ප්‍රනාන්දු මහත්මිය Super Handyman Services (SHS) හි සේවය ලබා ගත්තාය. ඇය SHS වෙත රු. 40000/- ගෙවූ අතර ඉතිරි රු. 60000/- වැඩ අවසන් වූ පසු ගෙවිය යුතුය.

පහත සිදුවීම් මත පදනම්ව ප්‍රනාන්දු මහත්මියගේ ගිවිසුම්වල බලපෑම සලකා බලන්න:

(අ) 2019 මැයි 15 වන දින, SHS විසින් පළමු තානායමේ වැඩ අවසන් කර ඇති නමුත්, දෙවන තානායමේ වැඩ ආරම්භ කර නොමැති විට, දෙවන නිවසට දැඩි අකුණු සැර වැදී, ගින්නකින් තානායම් දෙකම විනාශ විය.

(ආ) ඉහත දැක්වූ (අ) සිදුවීම සිදු නොවූ බව උපකල්පනය කරන්න. නමුත් Covid-19 හේතුවෙන් රජය විසින් අනපේක්ෂිත සංචාරක සීමා පැනවීමේ ප්‍රතිඵලයක් ලෙස, ABC Services වෙත බලාපොරොත්තු වූවාට වඩා අඩු සංචාරකයින් ලැබී ඇත. එබැවින්, ABC Services 2019 මැයි 25 දින ප්‍රනාන්දු මහත්මියට පැවසුවේ ඇයගේ තානායම් භාවිතා කිරීමට අවශ්‍ය නොවන බවත් ඔවුන්ගේ ගිවිසුම අවසන් වී ඇති බවත්ය. දැනටමත් ගෙවා ඇති රු. 300000/- ආපසු ගෙවන ලෙස ද ඉල්ලා සිටියේය.

(25x 2 = ලකුණු 50)

06. රංජිත් කොළඹ ප්‍රදේශයේ ඇඟලුම් ව්‍යාපාරයක නිරතව සිටියේය. ඔහු තරු පහේ හෝටලයකට උසස් තත්ත්වයේ තිර රෙදි 250ක් සැදීමට ගිවිසුමකට එළැඹුණේය. ගිවිසුමට එළඹීමෙන් මාස තුනකට පසු තිර රෙදි ලබා දීමට නියමිතව තිබුණි. ඉන්දියාවෙන් රෙදි ගෙන්වා තිර රෙදි සැදීම සඳහා තම ගබඩාවට ලබාදීමට රංජිත් නුවන් සමඟ තවත් ගිවිසුමකට එළැඹුණේය. මාසයක් ඇතුළත රෙදි නුවන්ට ලැබුණත් ඔහු වෙනත් වැඩකටයුතුවල නිරතව සිටීම නිසා වරායෙන් රෙදි නිෂ්කාශනය කර ගැනීම ප්‍රමාද විය. රෙදි බෙදා හැරීම මාස පහක් ප්‍රමාද වූ අතර, ඒ අනුව, එකඟ වූ වේලාවට හෝටලයට තිර රෙදි ලබා දීමට එය බලපෑවේය.

හෝටල් කළමනාකාරීත්වය තිර රෙදි භාර ගැනීම ප්‍රතික්ෂේප කළ අතර රංජිත් ගිවිසුම කඩ කර ඇති බවට තර්ක කළේය. විශේෂ උත්සවයක් සඳහා යොදා ගැනීමට නියමිත තිර රෙදි ලබා නොදීම හේතුවෙන් තම ව්‍යාපාරයෙන් අපේක්ෂිත ලාභය අහිමි වූ බැවින් රංජිත්ගෙන් වන්දි ඉල්ලා සිටීමට ඔවුහු කැමැත්තෙන් සිටිති. රංජිත් සහ හෝටලය අතර වන ගිවිසුමේ සඳහන් වන්නේ ගිවිසුම්ගත වගකීම් ඉටු නොකරන අවස්ථාවකදී ගිවිසුම කඩ කරන පාර්ශ්වය විසින් වන්දි ලෙස රුපියල් මිලියන 5ක් ගෙවිය යුතු බවයි. නුවන් තර්ක කරන්නේ රෙදි භාර දෙන තුරු ඒ ගැන කිසි දිනක විමසා නැති නිසා රංජිත් නොසැලකිලිමත් වූ බවයි.

රංජිත්ට සහ හෝටල් කළමනාකාරීත්වයට දී ඇති තත්ත්වය තුළ ලබා ගත හැකි ප්‍රතිකර්ම තිබේද යන්න පිළිබඳව උපදෙස් දෙන්න. ඔබගේ පිළිතුර නඩු තීන්දු අධිකාරීන් ඇසුරින් තහවුරු විය යුතුය.

(ලකුණු 100)

*******